**රත්නපුර ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූනි 07 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට රත්නපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුල වැඩ අවසන් කල ඉදිකිරීම් කර්මාන්ත 05 ක් වෙනුවෙන් ගෙවිය යුතුව තිබූ එකතුව රු. 525,904 ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම හා 2017 දෙසැම්බර් 31 දිනට ණයහිමියෝ සමාන වටිනාකමකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් ක්‍රියාත්මක කල කර්මාන්තයකට අදාල රඳවුම් මුදල වූ රු. 49,230 ක් වෙනුවට රු. 748,642 ක් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ප්‍රාග්ධන වියදම හා 2017 දෙසැම්බර් 31 දිනට ණයහිමියෝ රු. 699,412 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබුණු එකතුව රු. 34,714 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබීම හේතුවෙන් දේපල පිරියත හා උපකරණ ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් ප්‍රතිපූර්ණ ආදායම රු. 16,202,073 ක් වුවත්, එම වටිනාකම රු. 16,288,086 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු. 86,013 ක් වැඩියෙන් දක්වා තිබුණි.

#### 1.3.2 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කල පුරනැඟුම ව්‍යාපෘතිය යටතේ ආධාර වශයෙන් ලද බහුකාර්යය ගොඩනැගිල්ලේ වටිනාකම වශයෙන් රුපියල් මිලියන 42.99 ක් ප්‍රාග්ධනය යෙදුමට ආධාර මඟින් දායක වීමේ ගිණුම මඟින් ප්‍රාග්ධනිත කර තිබුණද, එම ගොඩනැගිල්ලේ පිරිවැය තහවුරු කර ගැනීම සඳහා වූ කිසිඳු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**1.3.3 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) මුදල් රෙගුලාසි 396 | 23,552 | නිකුත් කල දින සිට මාස 06 ක් ඉක්මවා තිබුණු බැංකුවට ඉදිරිපත් නොකල චෙක්පත් 11 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 754 | | සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම බඩු ලේඛන පොත තුලනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 1645 | | සභාව සතු වාහන 03 කට අදාල ධාවන සටහන් අඛණ්ඩව විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 03 ඡේදය | | අපහරණය කල යුතු වාහන හඳුනා ගැනීම සඳහා සුදුසුකම් ලත් කමිටුවක් පත්කර නොතිබුණු අතර, ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ අධිකාරීගේ නිර්දේශය අනුව සභාවට අයත් කැබ් රථ 03 ක් හා ලොරි රථයක් වෙන්දේසි කිරීමට තීරණය කර තිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 12,676,436 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 4,160,459 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

## 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | 2016 බිල් කළ ආදායම | 2016 රැස්කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 157,840 | 837,043 | 847,136 | 60,457 | 301,400 | 292,341 | 308,300 | 66,683 |
| කුලී | 455,000 | 96,678 | 96,678 | - | 765,500 | 260,811 | 260,811 | - |
| බලපත්‍ර ගාස්තු | 690,200 | 1,007,875 | 1,007,875 | 182,780 | 524,650 | 680,286 | 691,236 | 182,780 |
| වෙනත් ආදායම් | 27,347,500 | 17,151,122 | 10,737,057 | 30,969,407 | 29,712,950 | 9,893,795 | 10,499,639 | 20,777,423 |

## 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු, බලපත්‍ර ගාස්තු හා සේවා සඳහා ගාස්තු යන ආදායම් විෂයයන්ගෙන් රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 437, සියයට 46 හා සියයට 02 කින් වැඩි වී තිබූ අතර, බදුකුලී ආදායම, වරෙන්තු හා දඩ, වෙනත් ආදායම් හා රජයේ දායකත්වය යන ආදායම් විෂයයන්ගේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 79, සියයට 26, සියයට 96 හා සියයට 24 කින් අඩුවී තිබුණි.

## 2.2.3 වරිපනම්

සභා බල ප්‍රදේශය තුල වරිපනම් අයකර ගැනීම සඳහා දියුණු ගම් ප්‍රදේශ 06 ක් 2014 ජූනි 30 දින වනවිට හඳුනාගෙන තිබුණද, දියුණු ගම් ප්‍රදේශ වල සිතියම ප්‍රකාශයට පත්කිරීම සඳහා සීමා මායිම් ඇතුලත් සිතියම සකස් කිරීම දිගින් දිගටම ප්‍රමාද වී තිබීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් සභාවට ප්‍රධාන ආදායම් මාර්ගයක් අහිමි වී තිබුණි.

## 2.2.4 බලපත්‍ර ගාස්තු

2008 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව අයවියයුතු එකතුව රු. 182,760 ක වෙළඳ බලපත්‍ර ගාස්තු ශේෂය අයකර ගැනිමට සභාව අපොහොසත් වී තිබුණු අතර, එම ශේෂය කපා හැරීම සඳහා 2018 මාර්තු 09 දින පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ඉල්ලා තිබුණි.

## 2.2.5 වෙනත් ආදායම්

කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු අයවිය යුතු ආයතන සම්බන්ධයෙන් සමීක්ෂණයක් කර නොතිබුණි.

**2.2.6** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**-----------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාල උසාවි දඩ ආදායම හඳුනාගෙන අයකර ගැනීමට 2018 මාර්තු වනවිටත් අපොහොසත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.1** **කාර්යසාධනය**

**---------------**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

**------------------------------**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**(ආ)** **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

**---------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93(ආ) හා (ඇ) උප වගන්ති ප්‍රකාරව සියළුම නිවාස වල තිබෙන කසළ නිසි කාල සීමාවන් වලදී විධිමත් ලෙස ඉවත් කිරීම සඳහා සහ වීථි වල තිබෙන සියළුම කසළ සහ මල බැහැර කිරීම සඳහා ස්වකීය ප්‍රදේශය ඇතුලත හැකිතාක් දුරට අවශ්‍ය සියළු පියවර ගැනීම ප්‍රාදේශීය සභාවේ කාර්යයක්ව තිබියදී හා ප්‍රදේශවාසීන් විසින් එකී සේවාව ලබාදෙන ලෙස ඉල්ලීම් කර තිබියදී විධිමත් කසළ කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ii) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(ix)(ආ) වගන්තිය ප්‍රකාරව මලාපවහනය සහ කසළ ශෝධනය හා ඒ සඳහා ගාස්තු අය කිරීම, අතුරු ව්‍යවස්ථා වලට විෂයය වන කරුණක් වශයෙන් දක්වා තිබුණද, 2017 දෙසැම්බර් 31 දින වනවිටත් ඒ සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන ක්‍රියාත්මක කිරීමට සභාව අපොහොසත් වී තිබුණි.

**(ඇ)** **තිරසර සංවර්ධන ඉලක්ක**

**-----------------------------**

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 මැයි වනවිටත් සකස් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වී තිබූ විෂයයන් 16 කට අදාල භාණ්ඩ ඒකක 33 ක ඌනතාවය සම්බන්ධයෙන් 2017 දෙසැම්බර් 31 දින වනවිටද මුදල් රෙගුලාසි 103 ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර, එම වාර්තාවේ සෙසු නිර්දේශ ද ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) සභාවට අයත් කැබ් රථයක ඉන්ධන ටැංකියේ ධාරිතාවය ලීටර් 65 ක් වුවද, 2017 ජනවාරි 24 දින සිට 2017 ජූනි 12 දින දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව සිදුකල ධාවන සටහන් පරීක්ෂාවට අනුව ඉන්ධන ලීටර 230 සිට ලීටර 368 දක්වා ප්‍රමාණයක් ඉතිරිව තිබිය යුතු විය. එහෙත් ඒ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර, එම තත්ත්වය දිගින් දිගටම වර්ධනය වෙමින් පැවතුණි.

(ඇ) උප පත්‍රිකා පොත් ලැබීම් හා නිකුත් කිරීම් රජයේ මුදල් රෙගුලාසි 341 ප්‍රකාරව පිළියෙල කරන ලද උප පත්‍රිකා පොත් ලේඛනයේ සටහන් කල යුතු වුවද, ඉන්ධන ඇණවුම් උප පත්‍රිකා පොත් එසේ සටහන් කර නොතිබුණු අතර, අනුක්‍රමික අංක පිළිවෙල නොසලකා නිකුත් කිරීම කර තිබුණි. එමෙන්ම ඉන්ධන ඇණවුම් නිකුත් කිරීම හා ඒ සඳහා ගෙවීම් කිරීම සම්බන්ධයෙන් වූ අභ්‍යන්තර පාලනය ද දුර්වල තත්ත්වයක පැවතුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙහි 24 වගන්තියේ 1(අ) හා (ආ) යන උප වගන්ති ප්‍රකාරව ප්‍රාදේශීය සභාව මඟින් පවත්වාගෙන යනු ලබන පාරවල් සහ පටු මාවත් වල ස්ථිර සලකුණු හා සීමා ලකුණු කිරීමද එම පාරවල් වල සහ පටු මාවත් වල සැලැස්මවල් පිළියෙල කිරීමට කටයුතු කිරීමද එම පාරවල් වල සහ පටු මාවත් වල නාම ලේඛනයක් දක්වමින් නියෝග වල නියම කර ඇති ආකාරයට දැන්වීම් පල කිරීමට කටයුතු සැලැස්වීමද සෑම ප්‍රාදේශීය සභාවකම කාර්යය විය යුතුය. එසේ වුවද, සභාව විසින් යථෝක්ත වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර, 2017 දෙසැම්බර් 31 දින වනවිටත් සභාව සතු මාර්ග ගැසට් කිරීමට අපොහොසත් වී තිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

සභාවට අයත් සුසාන භූමි 70 ක් පැවතියද, ඉන් 68 ක අයිතිය නිරවුල් කරගෙන නොතිබුණි.

**3.5 ප්‍රසම්පාදනය**

**ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වැය විෂයයන් 29 ක් සඳහා සලසා තිබුණු රු. 6,109,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 07 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ප්‍රතිපාදනයෙන් සියයට 86 ත් සියයට 99.9 ත් අතර පරාසයක පැවතුණි.

(ඇ) වැය විෂයයන් 03 කට අදාලව ප්‍රතිපාදන ඉක්මවූ වියදම් දැරීම් වල එකතුව රු. 45,173 ක් විය.

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

**--------------------------------------**

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

**--------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ආදායම් වැඩියෙන් ගිණුම්ගත කර තිබීම |
| | | (ii) | ලෙජර් ගිණුම් හා උපයෝගී ලේඛන නොසැසඳීම |
| | | (iii) | ගිණුම් වලින් අත්හැරීම් තිබීම |
| (ආ) | ආදායම් පරිපාලනය | | නියමිත ආදායම අයකර නොගැනීම |
| (ඇ) | වත්කම් උපයෝජනය | | වත්කම් වල අයිතිය නිරවුල් කර ගැනීමට පියවර ගෙන නොතිබීම |